**සමාජ විද්‍යා කලාප තරඟාවලිය - 2023**

**කාලය - පැය 02 යි.** **11 ශ්‍රේණිය**

**ශිෂ්‍ය / ශිෂ්‍යාවගේ නම : -**

**විදුහලේ නම:-**

**ඔබ පාසල අයත් වන කාණ්ඩය යටින් ඉරක් අඳින්න.**

**200 දක්වා / 201 සිට 500 දක්වා / 501 සිට 1000 දක්වා / 1000ට වැඩි**

- **සියළුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) ඉංග්‍රීසින්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය පිහිටා තිබුනේ කුමන නගරයකද?
i .බොම්බාය ii.මද්‍රාසිය iii.කල්කටා iv.පොන්ඩිචේරි

(2) ප්‍රථම වරට ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් කණ්ඩායම බහුතරය බවට පත් වූයේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේද?
i .කෘෘව් මැකලම් ii.ඩොනමෝර් iii.මැනිං iv.මැනිං - ඩෙවෝන්ෂයර්

(3) 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නීති සම්පාදනය කරනු ලබන ආයතනය හඳුන්වන ලද්දේ කුමන නමකින්ද?
i .ජාතික රාජ්‍ය සභාව ii. ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව
iii. රාජ්‍ය මන්ත්‍රණ සභාව iv. ව්‍යවස්ථාදායක සභාව

(4) ලෝකයේ වාර්ෂික මිනිරන් නිෂ්පාදනයෙන් වැඩිම ප්‍රමාණයක් නිපදවමින් ප්‍රධාන මිනිරන් නිෂ්පාදකයා බවට පත් වී ඇති රට වන්නේ,
i .කොරියාව යි. ii.බ්‍රසීලය යි. iii.ශ්‍රී ලංකාව යි. iv.ඉන්දියාව යි.

(5) ශ්‍රී ලංකාවේ වර්තමානයේ පැන නැගී ඇති බලශක්ති අර්බුදයට විසඳුමක් ලෙස භාවිත හැකි වඩාත්ම සුදුසු බලශක්ති ප්‍රභවය කුමක්ද?
i .ජෛව ස්කන්ධ ii. සුළං
iii. පෙට්‍රෝලියම් iv. සූර්ය ශක්තිය

(6) ලෝකයේ ප්‍රධාන ඛනිජ තෙල් අපනයනය කරනු ලබන රට කුමක්ද?
i .නයිජීරියාව ii. එක්සත් අරාබි එමීර් රාජ්‍යය
iii. රුසියානු සමූහ ආණ්ඩුව iv. ඉරාකය

(7) ශ්‍රී ලංකාවේ ශුෂ්ක හා අර්ධ ශුෂ්ක කලාපය තුළ ව්‍යාප්තව පවතින භූගත ජල ද්‍රෝණි පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?
i .වනාතවිල්ලු, මන්නාරම, මුලතිව් ii. වනාතවිල්ලු, මුලතිව්,මුලුන්කාවිල්
iii. මන්නාරම, මුලතිව්, කිලිනොච්චි iv. වනාතවිල්ලු, මන්නාරම,මුලුන්කාවිල්

(8) ශ්‍රී ලාංකිකයෙකු විසින් පිටරටක දී කරනු ලබන වරදක් සම්බන්ධයෙන් අධිකරණ බලතල ක්‍රියාත්මක කරනු ලබන ආයතනය වන්නේ,
i .ශ්‍රේෂ්ඨාධිකරණය යි. ii. මහාධිකරණය යි.
iii. දිසා අධිකරණය යි. iv. මහේස්ත්‍රාත් අධිකරණය යි.

(9) ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා පිහිටුවා ඇති ශ්‍රී ලංකා ළමා දුරකථන සේවයෙහි (Child line sri lanka) අංකය කුමක්ද?
i .1969 ii.1990 iii.1930 iv.1929

(10) ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීම සඳහා "උරගල" නම් ප්‍රකාශනය නිකුත් කොට ලාංකික ජනතාව අතර බෙදාහරින ලද්දේ,

i. ලන්ඩන් මිෂනාරි සමාගම විසිනි. ii. වර්ච් මිෂනාරි සමාගම විසිනි.
iii. බැප්ටිස්ට් මිෂනාරි සමාගම විසිනි. iv. ඇමරිකන් මිෂනාරි සමාගම විසිනි.

❖ **11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**

(11) මෙරට බෞද්ධ පුනරුද ව්‍යාපාර සමයේ දී අනුරාධපුරයේ පූජනීය ස්ථාන රැක ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලද්දේ
................................................................................තුමා විසිනි.

(12) ශ්‍රී ලංකාවේ කෝපි වගාව විනාශ වීමට ප්‍රධානම හේතුව වූයේ.....................................
..............................................................................................නම් දිලීර රෝගය පැතිර යාමයි.

(13) මැතකදී ජාතික උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද "දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා" ගීතය රචනා කරන ලද්දේ ....................................................................මහතා විසිනි.

(14) මධ්‍යම ආණ්ඩුව විසින් ප්‍රාදේශිකව ඉටුකළ යුතු සංවර්ධන කටයුතු පහසු කර ගැනීම සඳහා
.................................................................................... ආයතන පිහිටුවා ඇත.

(15) සෑම වෙරළබඩ රාජ්‍යයකට ම හිමි වෙරළ සීමාවේ සිට නාවික සැතපුම් 12 ක් දක්වා මුහුදු සීමාව
.................................................................................... මුහුදු සීමාව ලෙස හැඳින්වේ.

(ලකුණු 2×5 = 10)

❖ **ප්‍රශ්න අංක 16 – 20 දක්වා කෙටි පිළිතුරු සපයන්න.**

(16) ශ්‍රී ලංකාවේ සූර්ය ශක්තිය මගින් බලශක්ති උත්පාදනය සඳහා සූර්ය බලාගාරයක් පිහිටුවා ඇති ස්ථානය නම් කරන්න.
..........................................................................................................

(17) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ විධිමත් දත්ත රැස් කරනු ලබන ආයතනය කුමක් ද?
..........................................................................................................

(18) කාර්මික විප්ලව සමයේ අමුද්‍රව්‍ය, ප්‍රාග්ධනය හා නිෂ්පාදන ද්‍රව්‍ය බෙදාහරින මධ්‍යස්ථානයක් ලෙස වැදගත් වූ බ්‍රිතාන්‍ය නගරය නම් කරන්න.
..........................................................................................................

(19) 1848 නිදහස් සටන සිදුවන කාල වකවානුවේ දී මෙරට පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවුරුන්ද?
..........................................................................................................

(20) ලෝකයේ මිනිස් අයිතිවාසිකම් දිනාගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ප්‍රථම ඓතිහාසික ලියවිල්ල කුමක්ද?
..........................................................................................................

(ලකුණු 2×5 = 10)

❖ **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ඇති ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

(21)



A. මෙම රූපයේ දැක්වෙන මූර්තිය නම් කරන්න.

.......................................................................

B. ශ්‍රී ලංකාව තුළ මෙය ලාංඡනයක් ලෙස යොදා ගන්නේ කුමන ක්ෂේත්‍රයකදී ද?

.......................................................................

(22)



A. යාබද රූපයේ දැක්වෙන ජන කණ්ඩායම නම් කරන්න.

.......................................................................

B. වර්තමානයේ මෙම ජන කණ්ඩායමේ නායකත්වය දරන්නේ කවුරුන්ද?

.......................................................................

(23)



A. යාබද රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

.................................................................

B. එය සොයා ගන්නා ලද්දේ කවුරුන් විසින් ද?

.......................................................................

(24)



A. මෙම රූපයේ දැක්වෙන පරිසර පද්ධතිය නම් කරන්න.

.......................................................................

B. මෙම පරිසර පද්ධතිය ආශ්‍රිත ප්‍රදේශවල ප්‍රධාන වර්ෂා ඍතුව නම් කරන්න.

.......................................................................

(25) 

A. යාබද රූපයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

.....................................................................

B. මොහුගේ නායකත්වය යටතේ පිහිටුවා ගන්නා ලද දේශපාලන පක්ෂය නම් කරන්න.

.....................................................................

❖ **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්නවලට "අ" තීරුව "ආ" තීරුව යනුවෙන් තීරු 02 ක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාවය අනුව ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| (26) 1. සාගර හා මුහුදුවල ඇති ජලය | A. පාංශු ජලය |
| 2. පසට උරාගන්නා ජලය | B. භූතල ජලය |
| 3. පොළොව අභ්‍යන්තරයේ තැන්පත්වන ජලය | C. භූගත ජලය |
| 4. ගංඟා, ඇළ දොළ හා හිම ප්‍රදේශවල ඇති ජලය | D. සාගර ජලය |

i .A C B D      ii.A B C D      iii.C D A B      iv.D A C B

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| (27) 1. මියුල් යන්ත්‍රය | A. ඩෙම්ලර් |
| 2. වාෂ්ප එංජිම | B. සැමුවෙල් ක්‍රොම්ප්ටන් |
| 3. ආරක්ෂක ලාම්පුව | C. ජේම්ස් වෝට් |
| 4. මෝටර් රථය | D. හම්ප්‍රි ඩේවි |

i .A C D B      ii.B C D A      iii.C D A B      iv.D A B C

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| (28) 1.හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා | A. යාපනය ශිවංගල විද්‍යාලය |
| 2. ආරුමුග නාවලර්තුමා | B. කොළඹ ආනන්ද විද්‍යාලය |
| 3. පොන්නම්බලම් රාමනාදන් මහතා | C. කොළඹ සහිරා විද්‍යාලය |
| 4. එම්.සී සිද්දි ලෙබ්බේ | D. පරමේෂ්වර විද්‍යාලය |

i .B A D C      ii.A C B D      iii.C D B A      iv.D B A C

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| (29) 1.1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රමය | A. විධායක කාරක සභා ක්‍රමය |
| 2. 1910 මැනිං ආණ්ඩුක්‍රමය | B. අග්‍රාණ්ඩුකාර තනතුර |
| 3. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය | C. ව්‍යවස්ථාදායක හා විධායක සභා |
| 4. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය | D. සීමිත ඡන්දයෙන් නියෝජිතයන් තේරීම. |

i .A D C B      ii.B C D A      iii.C D A B      iv.D B C A

| “අ” තීරුව“ | ආ” තීරුව |
|---|---|
| (30) 1.එක්සත් ජාතික පක්ෂය | A. ඒ.ඊ.ගුණසිංහ මහතා |
| 2. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය | B. ඩී.එස්.සේනානායක මහතා |
| 3. පෙඩරල් පක්ෂය | C. එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා |
| 4. කම්කරු පක්ෂය | D. එස්.ජේ.වී.චෙල්වනායගම් මහතා |

i .A B D C ii.B C D A iii.C A B D iv.D A B C

(ලකුණු 2×5 = 10)

❖ **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(31) i. 1956 බලයට පත් වූ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ අගමැතිවරයා නම් කරන්න.

..........................................................................................................................

ii. එම මැතිවරණයේ දී “මහජන එක්සත් පෙරමුණ“ පිහිටුවීම සඳහා ඒකරාශි වූ දේශපාලන පක්ෂ 02 ක් නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

iii. 1956 බලයට පත් වූ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ 03 ක් නම් කරන්න.

..........................................................................................................................

(32) i. 1818 ප්‍රථම නිදහස් සටනේ නායකත්වය ගත් උඩරට ප්‍රභූවරයා නම් කරන්න.

..........................................................................................................................

ii. 1818 නිදහස් සටනට බලපෑ හේතු 02 ක් ලියන්න.

..........................................................................................................................

..........................................................................................................................

iii. A. උඩරට ඉංග්‍රීසි බලය ස්ථාවර කරමින් ඉංග්‍රීසින් විසින් නිකුත් කරන ලද ලියවිල්ල කුමක්ද?

..........................................................................................................................

B. 1848 නිදහස් සටනට තුඩු දුන් හේතු 02 ක් නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

(33) i. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය නම් කරන්න.

..........................................................................................................................

ii. වියළි කලාපීය ප්‍රදේශවල ගොවි ජනපද පිහිටුවීමේ අරමුණු 02 ක් ලියන්න.

..........................................................................................................................

..........................................................................................................................

iii. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග වගාව දියුණු කිරීම සඳහා රජය ගන්නා ලද ක්‍රියාමාර්ග 03 ක් ලියන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(34) i. මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රථම අදියර ආරම්භයේ දී ඉදිකළ අමුණ නම් කරන්න.

..........................................................................................................................

ii. මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ පහත නම් සඳහන් ජලාශ ඉදිකිරීම සඳහා ආධාර සපයන ලද රටවල් නම් කරන්න.

A. කොත්මලේ ජලාශය - ..................................................

B. රන්දෙණිගල ජලාශය - ..................................................

iii. මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අරමුණු 03 ක් ලියන්න.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

(35) i.ශ්‍රී ලංකාවේ පාංශු වර්ධන ක්‍රියාවලිය සඳහා වැදගත්ම සාධකය කුමක් ද?

..................................................................................................................................

ii. ශ්‍රී ලංකාව තුළ දැකිය හැකි ඛනිජ සම්පත් බෙදෙන ප්‍රධාන කොටස් 02 නම් කරන්න.

..................................................................................................................................

..................................................................................................................................

iii. වර්තමානයේ ඛනිජ සම්පත් සංරක්ෂණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග 03 ක් ලියන්න.

..................................................................................................................................


..................................................................................................................................

..................................................................................................................................

(ලකුණු 6×5 = 30)

❖ **අංක 36 – 45 දක්වා දී ඇති ස්ථාන ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි ලකුණු කොට නම් කරන්න.**

(36) ඌරාතොට
(37) මහනුවර
(38) කතරගම
(39) ගාල්ල
(40) ගල් ඔය
(41) මන්නාරම් දූපත
(42) කැළණිය
(43) හෝර්ටන් තැන්න
(44) දැදුරු ඔය
(45) මඩකලපුව




(ලකුණු 2×10 =



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න